# සංචාරක කර්මාන්තය හේතුවෙන් සීගිරිය හා තදාශ්‍රිතව සිදුව ඇති සමාජ, ආර්ථික සහ පාරිසරික බලපෑම් පිළිබඳ අධ්‍යයනයක්

පී.ජී.අයි.එස්. විජේවර්ධන[1]

මුඛ්‍ය පදඃ සීගිරිය, සංචාරක, සමාජ, ආර්ථික, පාරිසරික

## හැඳින්වීම

සංචාරක කර්මාන්තය යනු, ගෝලීය මට්ටමින් සීඝ්‍රයෙන් වර්ධනය වන ආදායම් ජනක ක්ෂේත්‍රයකි. එය බොහෝ රටවල් සඳහා විදේශ විනිමය ආදානය කරන උපාය මාර්ගයක් ලෙසින් මෙන්ම රැකියා අවස්ථා නිර්මාණය කරන, ආගන්තුක සන්නිවේදනය වර්ධනය කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කරගත් බහු ආකාරික ව්‍යාපාරික ක්ෂේත්‍රයක් වශයෙන් හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ වඩාත් ආකර්ෂණීය සංචාරක ස්ථාන අතර සීගිරිය විශේෂ ස්ථානයක් ගනියි. 1982 දී යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස නම් කරන ලද සීගිරිය, සංස්කෘතික, පුරාවිද්‍යාත්මක, ඉතිහාසමය හා පාරිසරිකමය වටිනාකම් රැසක් වටා සංචාරකයින් වසරකට ලක්ෂ ගණනින් ආකර්ෂණය කරගන්නා ඉතාමත් වටිනා සංස්කෘතික හා පෞරාණික උරුම ස්ථානයක් වශයෙන් හැඳින්විය හැකිය. එසේ වුවද, සංචාරක ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් සීගිරිය ප්‍රදේශය තුළ සහ එයට ආසන්න කලාපවල සමාජමය, ආර්ථිකමය හා පාරිසරික වශයෙන් සෘණාත්මක සහ ධනාත්මක බලපෑම් මතුවී ඇත. ඒ අනුව, සීගිරිය තදාශ්‍රිතව සහ ඉන් පරිබාහිරව සිදුව ඇති සමාජ, ආර්ථික සහ පාරිසරික සෘණාත්මක සහ ධනාත්මක බලපෑම් හඳුනා ගනිමින්, සෘණාත්මක බලපෑම් අවම කිරීමටත්, ධනාත්මක බලපෑම් තවත් වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය විකල්ප විසඳුම් ඉදිරිපත් කිරීම, මෙම පර්යේෂණය සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය උපයෝගී කර ගන්නා ලදී. ඒ අනුව දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය, දත්ත ඉදිරිපත් කිරීම භාවිතයට ගන්නා ලද ක්‍රමවේදයන් ලෙස පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ දී දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණය කිරීම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන්, සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, සංචාරක මාර්ගෝපදේශකයන්, සහ සංචාරක ව්‍යාපාරිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් සංචාරක කර්මාන්තයේ බලපෑම සහ කළමනාකරණ ක්‍රමවේද සහ අභියෝග පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබන ලදී.

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
isharasw26@gmail.com

එමෙන්ම දේශීය විදේශීය සංචාරකයින් සඳහා ප්‍රශ්නාවලී ගොඩනැගීම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංචාරක සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කරන ලද වාර්තා, දත්ත සහ සංඛ්‍යාලේඛන අධ්‍යයනය යන ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී.

මෙම ක්‍රමවේදයන් ඔස්සේ ලබාගත් දත්ත විශ්ලේෂණයේ දී ලබාගත් දත්ත අදාල කාණ්ඩවලට වෙන්කරමින් දත්ත විශ්ලේෂණය කරන ලද අතර අධ්‍යයන ප්‍රදේශවල වෙනස්වීම් පෙන්වා දීමට සහ අවශ්‍ය සිතියම් නිර්මාණය කර ගැනීම සඳහා ArcGIS 10.8 මෘදුකාංගය සහ Google Map ආදිය යොදා ගන්නා ලදී. ලබාගත් දත්ත ඉදිරිපත් කිරීමේදී ද එහි නිවැරදි සහ පැහැදිලි භාවය රඳා පවත්වා ගැනීම සඳහා විවිධ ශිල්ප ක්‍රම යොදා ගන්නා ලදී. ඒ අනුව සිතියම්, ඡායාරූප සහ වගු ආදිය මඟින් මෙම කාර්යය සිදුකරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම පර්යේෂණයේ දී ක්ෂේත්‍ර නිරීක්ෂණ, සරල සම්මුඛ සාකච්ඡා හා ලේඛන විශ්ලේෂණ ආදිය මඟින් ලබාගත් දත්ත අනුව, සීගිරිය පදනම් කරගත් සංචාරක කර්මාන්තය තුළින් සමාජ, ආර්ථික හා පාරිසරික මට්ටම්වලින් ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් ඇති වී පවතින බව හෙළිවිය.

සමාජමය බලපෑම් වශයෙන්, සීගිරිය වටා සිටින ප්‍රදේශවාසීන්ගේ සමාජ ජීවිතයේ විශේෂ වෙනස්කම් මතුවී ඇත. සමාජමය වශයෙන්, ප්‍රදේශවාසීන්ගේ ජීවිත තත්ත්වය උසස්වීමක් ඇතිව තිබුණද, සංචාරකයින් සමඟ ඇතිවන සම්බන්ධතා හේතුවෙන්, විශේෂයෙන්ම තරුණයින් අතර බස, ඇඳුම් රටාවන්, ආචාර විධි සහ සම්ප්‍රදායික චරිතාකම්වල පසුබෑසීමක් දැකිය හැකිය. විශේෂයෙන්ම තරුණ පරපුර අතර සම්ප්‍රදායික සංස්කෘතික චරිතාකම් දුර්වල වී තිබේ. එය සමාජ සංස්කෘතික පරිවර්තනයක් ඇති කරන අතර සැලකිලිමත් විය යුතු තර්ජනයක්ද වෙයි.

ආර්ථිකමය බලපෑම් වශයෙන්, සංචාරක කර්මාන්තය හේතුවෙන් සීගිරිය සහ එය අවට ප්‍රදේශවල ආර්ථිකය ගුණාත්මකව වර්ධනය වී ඇත. නවාතැන් පහසුකම්, දේශීය අලෙවි ව්‍යාපාර, මඟ පෙන්වීමේ සේවා වැනි ක්ෂේත්‍ර හරහා ජනතාවට රැකියා අවස්ථා වැඩිවී ඇති අතර, ආදායම් මට්ටමද උසස් වී ඇත. කෙසේ වෙතත්, ආදායම විදේශික සංචාරකයින් මත විශේෂයෙන් රඳා පවතින බැවින්, ඕනෑම ගෝලීය ආර්ථික පසුබෑසීමකින් එය පහළ යෑමේ අවදානමක් පවතී.

පාරිසරික බලපෑම් වශයෙන්, සංචාරකයින්ගේ වැඩිවීම හා අදාළ පහසුකම් සඳහා සිදුවන ඉදිකිරීම් නිසා සීගිරිය අවට පරිසර පද්ධතියට දැඩි බලපෑම් සිදුවී තිබේ. අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු නොවීම සහ ස්වභාවික ජෛව විවිධත්වය අවදානම් වන ආකාරයේ විවිධ ක්‍රියාකාරකම් වන අතර විශේෂයෙන්ම සීගිරිය වනාන්තර කලාපය තුළ වන විනාශය, සත්ත්ව ජීවීන්ගේ ජීවන පරිසර විනාශය, භූමි භාවිතය වෙනස්වීම්, පරිසර ආරක්ෂාවට තර්ජනයන් ආදිය සිදු වී ඇත.

මේ අනුව පැහැදිලිව දැක්වෙන්නේ, සංචාරක කර්මාන්තය සීගිරිය තුළ හා ඒ වටා ප්‍රදේශවල සමාජමය වශයෙන්, ආර්ථික වශයෙන් සහ පාරිසරික වශයෙන් සෘණාත්මක සහ ධනාත්මක බලපෑම් දෙකම ඇතිකරමින් පවතින බවය. එබැවින්, මෙම අභියෝග සාර්ථකව හසුරවමින් සංචාරක කර්මාන්තය තිරසාර මාර්ගයකට ගෙන යාම සඳහා නිවැරදි නීතිමය හා ක්‍රමෝපායික ව්‍යුහයක් ඇති කිරීම අත්‍යවශ්‍ය වන අතර ප්‍රජාමූලික සහභාගිත්වය, පාරිසරික ආරක්ෂාව, සහ වර්ධනීය සංචාරක ක්‍රමවේදවලට උනන්දුව දැක්වීම තුළින් සීගිරිය වැනි උරුමයක සංචාරක කර්මාන්තය තිරසාරව තහවුරු කළ හැකි ය.

## සමාලෝචනය

මෙම පර්යේෂණය තුළින් පැහැදිලිව හෙළිවන්නේ, සීගිරිය යන විශිෂ්ට සංස්කෘතික උරුමය වටා සංචාරක කර්මාන්තය විශාල වශයෙන් ව්‍යාප්ත වීමත් සමඟ, එය සමාජ, ආර්ථික සහ පාරිසරික අංශ තුළ විවිධ බලපෑම් ඇතිකර ඇති බවයි. සංචාරක ක්‍රියාකාරකම් මගින් ජනතාවට ආදායම් අවස්ථා හා ව්‍යාපාරික වාසි සැලසුණු ද, සම්ප්‍රදායික සංස්කෘතික වටිනාකම්වල අඩු වීමක් හා පාරිසරික විනාශයක් ද සිදුවී ඇත. මෙම පර්යේෂණය තුළින් තිරසාර සංචාරක කර්මාන්තයක් සඳහා අවශ්‍ය වන පදනම්, වගකීම් සහ සුරැකුම් ව්‍යුහයන් පිළිබඳ අවධානය යොමු කරයි. පාරිසරික සංරක්ෂණය, සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සහ ප්‍රජා මූලික සහභාගිත්වය තුළින් සීගිරිය තිරසාරව පවත්වාගෙන යා හැකිය.

එමනිසා, සීගිරිය වැනි උරුමයක් රැකගැනීම සඳහා සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේදී, පරිසර සංරක්ෂණය, සමාජමය සංවර්ධනය සහ ප්‍රජා මූලික සහභාගිත්වය විශේෂ අවධානයට ගැනීම අත්‍යවශ්‍ය වේ. රජයේ ආයතන, පෞද්ගලික ව්‍යාපාර, සහ ප්‍රජාව අතර සහයෝගිතාව මත පදනම් වූ, ක්‍රමෝපායික හා තිරසාර සංවර්ධන සැලසුමක් ක්‍රියාත්මක කළහොත් සීගිරිය උරුමය අනාගත පරපුර සඳහා ආරක්ෂා කරගත හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍රය

සුරංග, සිල්වා. ඩී.ඒ.සී, විජේකුමාර. (2011). ***සංචාරක සැලසුම්කරණය.*** කොළඹ: පී.ද ඇස් කුලරත්න මාවත.

ගුණවර්ධන, පී. සල්ඩින්, එම්. (2008). ***සංචාරක කර්මාන්තය දියුණුවෙමින් පවතින රටවල් සහ සංචාරක නිෂ්පාදන.*** ජා-ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

Lickorish, Lenard J, Jenkins, Carson L. (1997)' ***An Introduction to Tourism.*** London:

Reed Educational and Professional Publishing Ltd.